# සිංහල භාෂාව හා සාහිත්‍යය

## 7 ශ්‍රේණිය



### 17. පාඩම

### සුදන ගුණ

## නිපුණතාව 9.0

සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි.

## නිපුණතා මට්ටම 9.2

පොත පත පරිශීලනයෙන් සාරධර්ම වර්ධනය කර ගනියි.

## ක්‍රියාකාරකම 01

- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. සිංහලයෙහි හමුවන උපදේශ කාව්‍ය කෘති තුන නම් කරන්න.

    ......................................................................................................

2. තිරුක්කුරල් කාව්‍ය සංග්‍රහයේ කතුවරයා කවුද?

    ......................................................................................................

3. පරිච්ඡේද දහයකින් යුතු තිරුක්කුරල් ග්‍රන්ථයේ උපදේශ පද්‍ය කීයක් අන්තර්ගත ද?

    ......................................................................................................

4. තිරුක්කුරල් ග්‍රන්ථය සිංහලට පරිවර්තනය කළ පරිවර්තකයින් කවුද?

    ......................................................................................................

5. "කෙනෙකුන් කළ ගුණය - අමතක වීම නරකයි" යන කවියෙහි ඉතිරි පද සම්පූර්ණ කරන්න.

    ......................................................................................................

6. 'ලෝකෝපකාරය' කෘතියෙහි රචකයා නම් කරන්න.

.............................................................................................................................

7. ලෝකෝපකාරයෙහි ඇතුළත් පද්‍ය සංඛ්‍යාව කීය ද?

.............................................................................................................................

8. සම්පත්වලින් පරිභානියට පත් වුණත් සුදනෝ තම ගුණ දම් රැකීම අඩු නො කරන බව ලෝකෝපකාරයේ උපමා කර ඇත්තේ කුමකට ද?

.............................................................................................................................

9. 'සුභාෂිතය' ග්‍රන්ථයේ කතුවරයා නම් කරන්න.

.............................................................................................................................

10. පහත දැක්වෙන වචනවල අරුත් ලියන්න.

ඉසුරු - ................................ සවිසත - ...........................

# ක්‍රියාකාරකම 02

- පහත සඳහන් පදවලට සමානාර්ථ පද ලියන්න.

1. උදෑසන - ....................
2. ගැටලු - ....................
3. රාත්‍රිය - ....................
4. මැරෙන - ....................
5. කුසලතාව- ....................
6. භාෂාව - ....................
7. ශබ්දය - ....................
8. ඇඳුම් - ....................
9. ආයාසය - ....................
10. පණිවිඩය - ....................

## ක්‍රියාකාරකම 03

- මුලින් දී ඇති පදයට සමාන පදය තෝරන්න.

1. අඹර - බඹර, අරම, ගමන, ගුවන
2. තඹර - බඹරා, දඹරන්, නෙළුම්, පොකුණ
3. අඟන - අංගනය, මිදුල, කාන්තාව, මිතුරිය
4. පුරය - රට, නගරය, ගම, ප්‍රදේශය

## ක්‍රියාකාරකම 04

- පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පද ලියන්න.

1. සාර්ථක - ....................
2. පැහැදිලි - ....................
3. ප්‍රවීණ - ....................
4. ආත්ම - ....................
5. දැනුවත් - ....................
6. පක්ෂ - ....................
7. දුර්වල - ....................
8. හිතුවක්කාර - ....................
9. සරල - ....................
10. සාර - ....................

## ක්‍රියාකාරකම 05

- **පහත දැක්වෙන පදවලට විරුද්ධ අර්ථය දෙන පදයක් හා සමාන පදයක් දී ඇති වචනවලින් තෝරා ලියන්න.**

| පදය | විරුද්ධ පදය | සමාන පදය |
|---|---|---|
| 1. සතුට | ............................... | ............................... |
| 2. මනාපය | ............................... | ............................... |
| 3. ආදරය | ............................... | ............................... |
| 4. බාධාව | ............................... | ............................... |
| 5. පිරිසිදු | ............................... | ............................... |

(අමනාපය, ආලය, කැමැත්ත, අකලංක, අපවිත්‍ර, පිටිවහල, ආධාරය, යහළුවා, අනාදරය, ශෝකය, ප්‍රහර්ෂය, උපහාසය)

## ක්‍රියාකාරකම 01 - පිළිතුරු

1. ලෝවැඩ සඟරාව. සුභාෂිතය, ලෝකෝපකාරය.

2. තිරුවල්ලුවර්

3. 1330කි

4. චාල්ස් ද සිල්වා, ගොරොක්ගොඩ මිසිහාමි

5. "අගුණ කළ විටකදි - වහා අමතක වීම යහපති"

6. රණස්ගල්ලේ හිමි

7. 238කි.

8. රන් භාජනය කැඩුණත් එහි වටිනාකම හා බර අඩු නො වන්නාක් මෙනි.

9. අලගියවන්න මුකවෙටිතුමා

10. ඉසුරු - සම්පත් සව්සත - සියලු ජනයා

# ක්‍රියාකාරකම 02 - පිළිතුරු

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. උදෑසන | - | අරුණ | 2. ගැටලු | - | පැන |
| 3. රාත්‍රිය | - | රැය | 4. මැරෙන | - | මියයන |
| 5. කුසලතාව | - | දක්ෂතාව | 6. භාෂාව | - | බස |
| 7. ශබ්දය | - | හඬ | 8. ඇඳුම් | - | වස්ත්‍ර |
| 9. ආයාසය | - | ප්‍රයත්නය | 10. පණිවිඩය | - | හසුන |

# ක්‍රියාකාරකම 03 - පිළිතුරු

1. අඹර - බඹර, අරම, ගමන, ගුවන

2. තඹර - බඹරා, දඹරන්, නෙළුම්, පොකුණ

3. අඟන - අංගනය, මිදුල, කාන්තාව, මිතුරිය

4. පුරය - රට, නගරය, ගම, ප්‍රදේශය

# ක්‍රියාකාරකම 04 - පිළිතුරු

| | | | |
|---|---|---|---|
| 1. සාර්ථක | - අසාර්ථක | 2. පැහැදිලි | - අපැහැදිලි |
| 3. ප්‍රවීණ | - ආධුනික | 4. ආත්ම | - අනාත්ම |
| 5. දැනුවත් | - නො දැනුවත් | 6. පක්ෂ | - විපක්ෂ |
| 7. දුර්වල | - ශක්තිමත් | 8. හිතුවක්කාර | - කීකරු |
| 9. සරල | - සංකීර්ණ | 10. සාර | - අසාර |

# ක්‍රියාකාරකම 05 - පිළිතුරු

| පදය | විරුද්ධ පදය | සමාන පදය |
| --- | --- | --- |
| 1. සතුට | ශෝකය | ප්‍රහර්ෂය |
| 2. මනාපය | අමනාපය | කැමැත්ත |
| 3. ආදරය | අනාදරය | ආලය |
| 4. පිටිවහල | බාධාව | ආධාරය |
| 5. පිරිසිදු | අපවිත්‍ර | අකලංක |

සැකසුම - මහේන්ද්‍ර මද්දේගම
චන්ද්‍රරතන විද්‍යාලය, කැලණිය